## 2. ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලය

---------------------------------

### 2.1 විගණන විෂය පථය

--------------------

අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 28 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.6 දක්වා

ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන යාවත්කාලීන නොකිරීම**

-------------------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

--------------------

(i) මූලධන වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු රු.5,550,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) පුනරාවර්තන වැය විෂයයන් 15 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.8,773,003 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ත් සියයට 99 ත් අතර පරාසයක පැවතුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

2011 අප්‍රේල් 06 දින සේවය අතහැර ගිය නිලධාරියෙකුගේ රු.38,836 ක ණය ශේෂය හා 2011 අගෝස්තු 17 දින සේවය අවසන් කර ඇති නිලධාරියෙකුගේ රු.3,500 ක උත්සව අත්තිකාරම් ශේෂය 2012 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

## 2.4 අනුකූල නොවීම්

--------------------

**නිති, රීති, හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------------

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව ලබා ගත් අත්තිකාරම එම කාර්ය නිමවූ වහාම පියවිය යුතු වුවත්**,** ලබා ගෙන තිබුණු රු.272,582 ක අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දින වන තෙක් පියවා නොතිබුණි. එසේම අත්තිකාරම් ලබා ගැනීමේදී විධිමත් පරිදි ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

## 2.5 පාඩු හා හානි

-------------

මෝටර් රථ සඳහා තෙවන පාර්ශවයේ රක්ෂණ ආවරණ ලබා ගැනිම හා වෙළඳ පොල වටිනාකමට වඩා අඩු වටිනාකමට රක්ෂණය කිරිම හේතුවෙන් මෝටර් රථ 04 ක් අනතුරුවලට ලක් විමෙන් සිදු වු එකතුව රු.1,242,417 ක් වු අලාභයන් ගෙන් රක්ෂණ වන්දි ලැබී තිබුණේ රු.257,770 ක් පමණි. ඒ අනුව රු.984,647 ක හානියක් අලාභයක් ලෙස කපා හැරීමට සිදු වී තිබුණි.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

--------------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 11 | 03 |
| (ආ) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (ඇ) | ද්විතීක මට්ටම | 44 | 43 | 01 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 67 | 62 | 05 |
| | එකතුව | 130 | 120 | 10 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 10 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.